# 10 ශ්‍රේණිය

# ශිල්ප කලා

## මැහුම් ක්‍රම භාවිතයෙන් නිර්මාණ කිරිම





e තක්සලාව
The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

සෑම කෙනෙක්ම නිර්මාණාත්මක අලංකාරවත් දේවලට කැමැත්තක් දක්වයි. එලෙස විවිධ දේ අලංකාරවත් කිරීමට යොදාගන්නා එක් ක්‍රමාවේදයක් මැහුම් ක්‍රම භාවිතය. මැහුම් ක්‍රම භාවිත කර පහත සඳහන් දෑ අලංකාරවත් කරගත හැකිය.

- ඇඳුම්
- කුෂන්කවර
- ඇඳ ඇතිරිලි
- කොට්ට උර
- මුදල් පසුම්බි
- බිත්ති සැරසිලි
- දොර ජනෙල් රෙදි
- බෑග්
- මේස රෙදි
- බඳුන් පලස්
- සැහැල්ලු සෙල්ලම් සතුන්

ආදිය මැහුම් ක්‍රම භාවිතයෙන් ඉතාමත් ආකර්ෂණීය ලෙස අලංකාර කර ගත හැකිය.

# මැහුම් ක්‍රම භාවිතයෙන් නිර්මාණ කිරිම





ඇඳුම්



මුදල් පසුම්බි




කුෂන්කවර




ඇඳ ඇතිරිලි



කොට්ට උර



බිත්ති සැරසිලි



මේස රෙදි



දොර ජනෙල් රෙදි



බෑග්



බදුන් පලස්

**මැහුම් ක්‍රම භාවිතයෙන් නිර්මාණ කිරීමේදී සැලකිලිමත්විය යුතු කරුණු,**

- මැහුම් ක්‍රම භාවිතයේදී දළ සැලැස්මක් ඇඳගනී.
- විවිධ මැහුම් යොදා ගැනීමේදී හැකි සෑමවිටම රාමුවක් භාවිත කිරීමෙන් රැලි නොවැටෙනසේ නිර්මාණය කර ගත හැකි වේ.
- මැහුම් ක්‍රම යොදාගන්නා මතුපිටට ගැලපෙන අයුරින් නූල්වල වර්ණ සංකලනය කිරීම.
- නිර්මාණය කළපසු නොපිටෙහි ඇති නූල් කැබලි නැවත හතුපිටට කොපෙනෙන්න මසා ගැනීම.
- ශක්තිමත් සේදීමේදී වර්ණ ඉවතවීනොයන ගුණාත්මක නූල් වර්ග භාවිත කිරීම.
- ඉදිකටු, රාමු, රෙදි වර්ග ද යොදා ගැනීමේදී සැලකිලිමත් විය යුතුවේ.

මැහුම් ක්‍රම භාවිතයෙන් නිර්මාණ කිරිමේදී වැඩි වශයෙන් පහත සඳහන් මැහුම් ක්‍රම භාවිත කිරිම දක්නට ලැබේ.

- නූල් ඇදීම
- නූල් දිවිම
- පිස්මෙන්තු මැස්ම
- නැටි මැස්ම
- ඕව කටින් මැස්ම
- දිග කොට මැස්ම
- ඇරෝ හෙඩ් මැස්ම
- ෂටින් මැස්ම
- වැලට් මැස්ම
- නූල් - ඇද සැටින් මැස්මෙන් මැස්ම
- හෙරින් බොන් මැස්ම

පහත සදහන් ගැට සහිත මැහුම් ක්‍රම ද අලංකාරවත් ලෙස භාවිත කල හැකිවේ.

- කොරල් මැස්ම
- ඩයමන් මැස්ම
- ගැට සහිත කතිර මැස්ම
- ස්ක්‍රෝල් මැස්ම
- ප්‍රංශ ගැට මැස්ම
- බුලියන් ( පනු ) මැස්ම
- බේව් සහිත අයින් මැස්ම
- තොණ්ඩු මැස්ම
- වාටි අයිනකට තොණ්ඩු මැස්ම

පහත සඳහන් දම්වැල් මැහුම් ක්‍රමද අලංකාරවත් ලෙස භාවිත කල හැකිය.

- ලේසි ඩේසි මැස්ම
- දම්වැල් මැස්ම
- සිග්සැග් මැස්ම
- ඇරුණු දම්වැල් මැස්ම
- වැසුනු පිහාටු මැස්ම
- කේබල් දම්වැල් මැස්ම
- යට කරල් මැස්ම
- හෙවු දම්වැල් මැස්ම

පහත සඳහන් තොණ්ඩු සහිත මැහුම් ක්‍රමද අලංකාරවත් ලෙස භාවිත කළ හැකිය.

- බොත්තම් කාස මැස්ම
- බ්ලැන්කට් මැස්ම
- ඩබල් පිහිටු මැස්ම
- වැසුණු පිහාටු මැස්ම
- ෆලයි මැස්ම
- ඩබල් ෆලයි මැස්ම
- රෝම මැස්ම
- රුමේනියා මැස්ම

ඉහත සඳහන් මැහුම් ක්‍රමවලට අමතරව ලොව පුරා මැහුම් ක්‍රම රාශියක් තිබේ. සරල මැහුම් ක්‍රම කිහිපයක් ප්‍රගුණ කිරීම තුලින්ද අලංකාරවත් වටිනා නිර්මාණ බිහි කිරිමට හැකියාව ලබේ.

## සරල මැහුම් ක්‍රම යොදාගෙන කවරයක් අලංකාර කර ගන්නා ආකාරය බලමු.

අවශ්‍ය ද්‍රව්‍යය:-

- ❖ අමු රෙදි :-
  - අගල් 17 දිග පළල රෙදි කැබලි 1 යි.
  - අගල් 20 දිග 17 ක් පළල රෙදි කැබලි 1 යි.

- ❖ අගල් 4 බැගින් දිග පළල වු වර්ණවත් පොප්ලින් රෙදි කැබලි 5 ක්
- ❖ අගල් 2 ½ බැගින් දිග පළල වු තවත් වර්ණයකින් පොප්ලින් කැබලි 4 ක්

අවශ්‍ය උපකරණ:-

- ❖ ඉදිකටු
- ❖ කතුර
- ❖ මහන රාමුව
- ❖ දිදාලය

උපදෙස්:-

- අගල් 4 බැගින් දිග පළල වූ රෙදි කැබලි පහේම අගල් ¼ බැගින් වටේටම මැහුම් වාසි තබා ගන්න.
- එම රෙදි කැබලි පහේම එකම ආකිරයට සරල මැහුම් ක්‍රම යොදාගෙන මල් මසා ගන්න. ( හෙරින් බොන්, දම්වැල්, බ්ලැන්කට් වැනි මැහුම් ක්‍රම සුදුසු වේ. )
- ඉන්පසු අගල් 2 ½ බැගින් කපාගත් රෙදි කැබලි හතරේද වටේටම අගල් ¼ බැගින් මැහුම් වාසි තබා ගන්න.
- එම රෙදි කැබලි හතරේද සරල මැහුම් ක්‍රම යොදා ගෙන මල් මසා ගන්න.
- ඉන්පසු අගල් 17 දිග අමුරෙදි කැබල්ල ගෙන රූපසටහනේ පරිදි කැබලි තබා බොරුනූල් ඇද ගන්න.


17
½
2`
2`
2`
2 ½
2 ½
2`
2`
මැහුම්වාසි
½
2 ½
2 ½
2`
2`
2`
2`
මැහුම්වාසි ½

- ඉන් පසු එම මල් මසාගත් සියලු රෙදි කැබලිවල දාරදිගේ අමු රෙද්දට හසුවෙන පරිදි සරල මැහුම් ක්‍රමයක් යොදා අලංකාරවත් ලෙස මල් මසාගත් රෙදි කැබලි වල දාර නොපෙනෙන ලෙස මසා ගන්න. ( බැලැන්කට් මැස්ම, පිහාටු මැස්ම, ඩබල් පිහාටු මැස්ම, ෆලයි මැස්ම, හෙරින්බොන් මැස්ම ඒ සඳහා වඩාත් සුදුසු වේ )
- ඉන්පසු අමුරෙද්ද පෙනෙන ස්ථානවලට ඔබ කැමති මැහුම් ක්‍රම යොදා ගෙන කුෂන් කවරයේ අලංකාරවත් බව වැඩි කර ගන්න.
- ඉන්පසු 20` දිග 17 පළල අමුරෙද්ද ගෙන එක්කෙටසක් 10` දිග වන ලෙස දෙකට කපා ගන්න.
- පෙරදි මැහුම් ක්‍රම යොදා අලංකාර කරගත් කුෂන් කවරයේ බදිරිපස පලුව ගෙන පිටිපස පලුව සඳහා සකසා ගත් 10` දිගවන අමුරෙදි කැබලි දෙක තබා කුෂන් කවරය මසා නිම කර ගන්න.